සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

## ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2018)

### (01) මූල්‍ය ක්‍රම

පැ දෙකයි

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

1. (i) 'අතුරු සම්මත ගිණුම' යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*
   (ii) වාර්ෂික වියදම් ඇස්තමේන්තුව සඳහා අරමුදල් සම්පාදනය කර ගත හැකි මාර්ග පහක් දක්වන්න. *(ලකුණු 15 යි)*

2. (i) රජයේ දෙපාර්තමේන්තුවක ගණකාධිකාරිවරයකු විසින් ඉටු කරනු ලබන කාර්යයන් (Functions) හයක් දක්වන්න. *(ලකුණු 15 යි)*
   (ii) ගිණුම් වර්ෂයක් අවසානයේ 'අග්‍රිම ශේෂය පියවීම' යන්නෙන් කුමක් අදහස් වේ දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

3. (i) රජයේ දෙපාර්තමේන්තු විසර්ජන ලෙජරයේ (Votes ledger) සටහන් කරනු ලබන කරුණු පහක් දක්වන්න. *(ලකුණු 10 යි)*
   (ii) මු.රෙ. 139 යටතේ මුදල් ගෙවන නිලධාරියකු (Paying Officer) තම ගණන් දීමේ නිලධාරියාට වගකිව යුතු කරුණු කවරේදැයි දක්වන්න. *(ලකුණු 15 යි)*

4. (i) මු.රෙ. 15 ට අනුව අත්තිකාරම් ගිණුම්වලට අදාළ ඇස්තමේන්තුවල සීමා වර්ග කවරේ ද? *(ලකුණු 05 යි)*
   (ii) රජයේ නිලධාරියකුගේ වැටුපෙන් අඩුකළ හැකි ව්‍යවස්ථාපිත අඩුකිරීම් තුනක් දක්වන්න. *(ලකුණු 05 යි)*
   (iii) බැංකු සැසඳුම් ප්‍රකාශයක් සකස් කිරීමේ දී ඔබ විසින් සලකා බැලිය යුතු කරුණු තුනක් සඳහන් කරන්න. *(ලකුණු 05 යි)*
   (iv) අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමේ වාසි තුනක් දක්වන්න. *(ලකුණු 05 යි)*
   (v) දෙපාර්තමේන්තු ගිණුම් භාණ්ඩාගාර ගිණුම් සමග මාසිකව සැසඳීමේ වාසි තුනක් සඳහන් කරන්න. *(ලකුණු 05 යි)*

5. මු.රෙ. 103 (1) ප්‍රකාර රජයේ දේපළක් නැති වූ විට හෝ කිසියම් දේපළකට අලාභ හානිවීමක් සිදු වූ විට ඒ සම්බන්ධයෙන් ගත යුතු පියවර කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 25 යි)*

6. පහත එක් එක් මාතෘකාව පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   (i) චෙක්පත් සම්බන්ධ විශේෂ රේඛනය
   (ii) ප්‍රසම්පාදනයට සම්බන්ධ මිල සැසඳුම් ක්‍රමය (Shopping method)
   (iii) ප්‍රධාන ගණන් දීමේ නිලධාරී
   (iv) ජීවත්ව සිටින බවට සහතිකය
   (v) භාණ්ඩාගාර සටහන්

*(ලකුණු 05 × 5 = 25 යි)*

* * *

Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන
පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2018)

**(02) පරිපාලනය**

පැ දෙකයි

එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.

---

## I කොටස

1. (i) රජයේ සේවයට නිලධරයකු බඳවා ගත් පසු පුහුණු කිරීමෙන් ලැබෙන වාසි කවරේ දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

   (ii) පහත දැක්වෙන පුහුණුවීමේ ක්‍රම පැහැදිලි කරන්න.
   - (අ) සේවාරම්භක පුහුණුව
   - (ආ) සේවාස්ථ පුහුණුව
   - (ඉ) සේවා මූලික පුහුණුව *(ලකුණු 15 යි)*

2. (i) රජයේ කාර්යාලයක් ස්ථානගත කිරීමේ දී සැලකිය යුතු කරුණු මොනවා දැයි සඳහන් කරන්න. *(ලකුණු 10 යි)*

   (ii) ආවෘත පිරිසැකැස්මක ඇති වාසි හා අවාසි පැහැදිලි කරන්න. *(ලකුණු 15 යි)*

3. (i) රාජ්‍ය ආයතනයක උසස් වීම් ලබාදීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 10 යි)*

   (ii) උසස්වීමක් උපයා ගැනීම සඳහා නිලධාරියෙකු සම්පූර්ණ කළයුතු 'සතුටුදායක සේවය' පැහැදිලි කරන්න. *(ලකුණු 15 යි)*

## II කොටස

4. (i) රාජ්‍ය සේවයේ නිලධරයකු පරිවාස කාලය තුළ දී රාජ්‍ය සේවය සඳහා සුදුසු තැනැත්තෙකු බව සනාථ කළයුතු ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

   (ii) රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරකට නව පත්වීමක් ලබන නිලධරයකුගේ පරිවාස කාලය සම්බන්ධ අධීක්ෂණ නිලධරයකුගේ වගකීම පැහැදිලි කරන්න. *(ලකුණු 15 යි)*

5. (i) දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට අයිතිවාසිකම් නොමැති නිලධාරීන් නම් කර, ඔවුන්ට භුක්ති විඳීමට හිමිකමක් නොමැති දේශපාලන අයිතිවාසිකම් කවරේ දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

   (ii) දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට හිමිකම් නොමැති නිලධරයකු ඡන්ද අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වන්නේ නම් ඒ සඳහා ආයතන සංග්‍රහයේ සලසා ඇති ප්‍රතිපාදන පැහැදිලි කරන්න. *(ලකුණු 15 යි)*

6. ආයතන සංග්‍රහයේ XLVII හා XLVIII පරිච්ඡේදවල දක්වා ඇති පරිදි පහත දැක්වෙන මාතෘකා සම්බන්ධව කෙටි සටහන් ලියන්න.

   (i) මත්පැන් හා විෂමත්ද්‍රව්‍ය භාවිතය

   (ii) විධිමත් විනය පරීක්ෂණයක පැමිණිල්ල මෙහෙයවීමේ නිලධාරි

   (iii) විනය නියෝගයක ඇතුළත් වියයුතු කරුණු

   (iv) චෝදනා පත්‍රයක අනිවාර්යයෙන් ම ඇතුළත් විය යුතු කරුණු

   (v) සුළු දඬුවම්

*(ලකුණු 05 × 5 = 25 යි)*

* * *

Department of Examinations Sri Lanka

[සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන
පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2018)

**(03) දෙපාර්තමේන්තු රෙගුලාසි - 1**

පැ දෙකයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

**1.** (i) එළගවයින් අපරට තුළට ආනයනයේ දී රෝග කාරකයන් ඇතුළුවීම වැලැක්වීම සඳහා කටයුතු කිරීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාට නීතිමය ප්‍රතිපාදන ලැබී ඇති පනත නම් කරන්න. *(ලකුණු 05 යි)*

(ii) ඉහත (i) හි හඳුනාගත් පනතේ ප්‍රතිපාදනවලට අනුව එළගවයින් ආනයනයේ දී රෝග කාරකයන් රට තුළට ඇතුළුවීම වැලැක්වීම සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගතහැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න. *(ලකුණු 20 යි)*

**2.** (i) 1986 අංක 15 දරන සත්ත්ව ආහාර පනත සහ 2016 අංක 15 දරන සත්ත්ව ආහාර (සංශෝධිත) පනත යන පනත් සම්මත කර ඇත්තේ කුමන අරමුණක් සඳහා දැයි සඳහන් කරන්න. *(ලකුණු 05 යි)*

(ii) ඉහත (i) හි සඳහන් අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා එම පනත්වලින් ප්‍රතිපාදන ලැබී ඇති ආකාරය විස්තර කරන්න. *(ලකුණු 20 යි)*

**3.** (i) ශ්‍රී ලංකාවේ රජයේ පශු වෛද්‍ය කාර්යාල මගින් එළගවයින් හා මී ගවයින් හඳුනා ගැනීම සඳහා භාවිත කරනු ලබන ක්‍රමය කුමක් දැයි කෙටියෙන් පහදන්න. *(ලකුණු 05 යි)*

(ii) ඉහත (i) හි සඳහන් ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාට නීතිමය ප්‍රතිපාදන ලැබී ඇති පනත කුමක් දැයි සඳහන් කරන්න. *(ලකුණු 05 යි)*

(iii) ඔබ ඉහත (i) හි දක්වා ඇති ක්‍රමයේ සාර්ථක අසාර්ථක බව කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

(iv) එළගවයින් සහ මී ගවයින් හඳුනාගැනීමේ වැදගත්කම පිළිබඳව සාකච්ඡා කරන්න. *(ලකුණු 10 යි)*

**4.** පහත දැක්වෙන මාතෘකා පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ශ්‍රී ලංකාව තුළ සත්ත්ව ආහාර විකිණීම සඳහා නිෂ්පාදනය කිරීමට බලපත්‍රයක් ලබාගැනීම *(ලකුණු 05 යි)*

(ii) ශ්‍රී ලංකාව තුළ පශු ඖෂධයක් නිෂ්පාදනය කිරීම සඳහා බලපත්‍රයක් ලබාගැනීම *(ලකුණු 05 යි)*

(iii) සත්ත්ව සායනයක් (animal clinic) ලෙස පවත්වාගෙන යනු ලබන ස්ථානයක් ලියාපදිංචි කිරීම *(ලකුණු 05 යි)*

(iv) බිත්තර රැක්කවීම මගින් කුකුළු පැටවුන් බෝකරන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කිරීම *(ලකුණු 05 යි)*

(v) අපනයනය කිරීම සඳහා මස් නිෂ්පාදන සකස් කරන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කිරීම *(ලකුණු 05 යි)*

***

Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන
පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2018)

**(04) දෙපාර්තමේන්තු රෙගුලාසි - 2**

පැ තුනයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.

1. ගව ආහාර ලෙස යොදා ගන්නා තෘණ හා පෝෂ (Pasture and fodder) සංරක්ෂණය කරන ක්‍රම පිළිබඳ ව පැහැදිලි කරන්න.

2. (i) 'ගව කෘත්‍රිම සිංචනය (Cattle artificial insemination)' ක්‍රියාවලිය පැහැදිලි කරන්න.
   (ii) කෘතිම සිංචනයේ සාර්ථකත්වය සඳහා එහි පසු විපරමෙහි වැදගත්කම සහ පසු විපරම සිදු කරන ආකාරය පැහැදිලි කරන්න.

3. පහත සඳහන් මාතෘකා අතුරින් හතරක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   (i) ලිංග නිර්ණය කරන ලද අධිශීත ගව ශුක්‍ර
   (ii) පිරිසිදු කිරි නිෂ්පාදනය
   (iii) කුර හා මුඛ රෝගය
   (iv) මස් පිණිස සතුන් ඝාතනයේ දී පූර්ව මරණ පරීක්ෂාව (Antimortem inspection)
   (v) දෛහික සෛල ගණනය (Somatic cell count) කිරිවල ගුණාත්මක භාවයේ දර්ශකයක් ලෙස භාවිත කිරීම

4. වාණිජ කිරි නිෂ්පාදන ගව පට්ටියක (Commercial dairy herd) ප්‍රජනක කාර්යක්ෂමතාව මැනීම සඳහා භාවිත කරන ප්‍රජනක දර්ශක විස්තර කරන්න.

5. (i) බෝවයින් වයිරල් ඩයරියා - මියුකෝසල් ඩිසීස් (BVD - MD) රෝගය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.
   (ii) BVD - MD රෝගය ගව ප්‍රජනනය කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න.
   (iii) BVD - MD රෝගය ව්‍යාප්ත වන ආකාරය සහ හඳුනා ගන්නා ආකාරය පැහැදිලි කරන්න.
   (iv) BVD - MD රෝගය පාලනය කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

* * *

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka